# මහනුවර යුගයේ පිරිවෙන් අධ්‍යාපනය

**කඹුරුපිටියේ වනරතන මහනාහිමිපාණන් වහන්සේ**

I වන විමලධර්මසූර්ය රජුගෙන් ආරම්භව ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය සමය තෙක් සියවස් තුනකට ආසන්න කාලයක් මහනුවර සමය **ලෙස** සැලකේ. මෙය වනාහි ලංකාවේ ඉතිහාස යුග අතරෙහි ඉතා පිරිහුණු යුගයකි. මෙවන් සමයක ලංකාවේ පෙර සිට පැවති පිරිවෙන් අධ්‍යාපනය ද සැහෙන දුරට පිරිහෙමින් පැවතුණි.

''පරිවෙණ'' ශබ්දයෙන් ඈත අතීතයෙහි කියවුණේ භික්ෂූන් වහන්සේ වාසය කරන කුටියකි. එසේත් නොවේනම් පවුරකින් හෝ වැටකින් වට වූ ආරාමයකි. අනුරාධපුර යුගයේ දී පවුරකින් වට වූ එවැනි කුටි සමූහයකින් යුක්ත ආරාමය **පිරිවෙන්** නමින් ව්‍යවහාර කළ බව පෙනී ගොස් ඇත. දීඝනිකායට්ඨකථාව ලිවීමට බුදුගොස් හිමියනට ආරාධනා කළේ අනුරාධපුර මහා විහාරයෙහි සුමංගල පිරිවෙන් වැසි දාඨානාග නම් සංඝස්ථවිරයන් වහන්සේ විසිනි. මෙහි ''සංඝථෙර'' යනුවෙන් ආයතනයේ ප්‍රධානියා කියවුන බව පෙනේ. එබැවින් සුමංගල පිරිවෙණ විශාල ආයතනයක් විය යුතුය. රසවාහිනී නම් පාලි ග්‍රන්ථය ලියූ රට්ඨපාල හිමිඳ අනුරාධපුර මහා විහාරයෙහි ගුත්තවංක පිරිවෙන් වැසි හිමිනමකි. මේ සියලු පිරිවෙන් එක්ව මහා විහාර නාමය භාවිත කොට ඇති බව පෙනේ. එය විශාල වශයෙන් පැවති විද්‍යා ස්ථානයක් ද විය හැක. දඹදිව නාලන්ද විශ්ව විද්‍යාලය එද ව්‍යවහාර කරන ලද්දේ ''නාලන්ද මහා විහාර'' යනුවෙනි. එබැවින් මහා විහාරය එකල විශ්ව විද්‍යාල තත්වයේ උසස් ආයතනයකි. පස්වැනි සියවසේ ලක්දිවට පැමිණි බුදුගොස් හිමියන් පරීක්ෂණයට ලක්කළ **ආකාරය** ගැන සිතන විට ද එද අනුරාධපුර මහා විහාරය විශ්වවිද්‍යාල තත්වයකින් පැවති බව කිව යුතුය. බුදුගොස් හිමියන්ට නවාතැන් ලැබුණේ ග්‍රන්ථාකර පිරිවෙණෙහිය. මෙහි පුස්තකාලය ඉන් අදහස් වේ යයි සිතිය හැකිය. එයත් පරිවෙණ නාමයෙන් ව්‍යවහාර කොට තිබේ. මේ අතින් සලකන විට ලංකාවේ පිරිවෙණ උසස් විද්‍යායතනයක තත්වයකින් පැවති බව පෙනී යයි.

පසුකලක ''මූලායතන'' නාමයෙන් ප්‍රසිද්ධියට පත් වූයේද මේ පිරිවෙන්මය. දොළොස්වන සියවසෙහි උත්තර මූලායතනාධිපතිව වැඩ විසූයේ මහා වෛයාකරණ රාජගුරු මහා මෞද්ගල්ලාන හිමියෝය. මුගලන් හිමියනට ඇති මේ විශේෂණ පද කීපයෙන් උන්වහන්සේ කවර පුද්ගලයෙක්ද ' යනු සිතා ගත හැකිය. සමහර විට මූලායතනයක් තුළ පිරිවෙන් කීපයක් තිබෙන්නටත් පුළුවන. කෝට්ටේ රාජ්‍ය සමය වන විට පිරිවෙණට ලැබුණේ උසස් තැනකි. එකල පිරිවෙන් නාමයෙන් සලකන ලද්දේ තත්කාලීන උසස් අධ්‍යාපනයක් දුන් ආයතනයකි. තොටගමුවේ ශ්‍රී විජයබාහු පිරිවෙණ, කෑරගල පද්මාවතී පිරිවෙණ, පැපිලියානේ සුනේත්‍රා මහා දේවී පිරිවෙණ යන මේ ආයතන එද උසස් අධ්‍යාපන ආයතනයෝ වූහ. පද්මාවතී පිරිවෙණෙහි අධ්‍යාපනය පිළිබඳවත් එහි අධිපතිව වැඩ විසූ වනරතන මා හිමියන්ගේ බුද්ධි ප්‍රභාවය පිළිබඳවත් හංස සංදේශය විස්තර කොට තිබේ. 15 වන සියවසේ පැවති මේ උසස් අධ්‍යාපන ක්‍රමය අනතුරුව ලැබූ මහනුවර සමය වන විට පරිහානියට පත්විය. ඈත්ත

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වශයෙන් මේ කාලය තුළ පිරිවෙණ යයි නම් කළ හැකි විද්‍යාස්ථානයක් නො වී... විදේශීය ආක්‍රමණයන්ගෙන් රටේ මහත් අවුල් තත්වයක් පැවති මේ යුගයෙහි ... පොත විනාශ වී යාමෙන් පිරිවෙන් අධ්‍යාපනය පවත්වාගෙන ගිය භික්ෂූන් වහන්සේ... මහත් කරදරවලට මුහුණ පෑමට සිදුවූ හෙයින් මේ අභාග්‍ය තත්වයට මුහුණ පාන්නට සිදුවිය. රටතුළ උපසම්පද භික්ෂූන් වහන්සේලා නිභවීමෙන් කීපවරක්ම උපසම්පදා... මෙරටට ගෙන ඒමද මෙයට ප්‍රධාන ශාක්ෂියකි.

මේ කාලය තුළ අරණ්‍යවාසී සමහර භික්ෂූන් වහන්සේලා විදර්ශනා භාවනා ... ආරක්ෂා කර ගනිමින් එක්තරා ක්‍රමයක ආගමික අධ්‍යාපනයක් දුන් අතර ග්‍රාමවාසී ඇතැම් භික්ෂූන් වහන්සේ තමන් පත පොතද ආරක්ෂා කර ගනිමින් සුළු වශයෙන් ඒ ඒ ආරාමයන්හි ආගමික අධ්‍යාපනයක් පවත්වා ගෙන ගියහ. සාමාන්‍යයෙන් ... පන්සල් අධ්‍යාපනය යන නමින් ද ව්‍යවහාර විය. එද පන්සල් අධ්‍යාපනය ... ප්‍රතිපත්තියට මුල් තැනක් ගෙන දෙමින් පැවිද්දන්ට මෙන් ගිහියන්ටද වැඩ සලස්වා ලදී. ඒ පිරිහුණු මහනුවර යුගයෙහි භික්ෂූන් වහන්සේ ස්වකීය පැවිදි ශිෂ්‍යයන් සඳහා ... වෙනම අධ්‍යාපනයක් දුන් අතර ශිෂ්‍යයන්ට අකුරු කරවීම, ජ්‍යොතිෂය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි එදිනෙද ජීවිතයට අවශ්‍ය ඉගැන්වීම් කළහ. අද මෙන් පහසුකම් නො... මැති ඒ යුගයෙහි අකුරු කරවීම පවා සිදු කරන ලද්දේ වැලිපිලෙහි අකුරු ලියවීමෙන් ... ගසක් යට වැලිපිලක් තනා ඒ වැලි පිලෙහි ඇඟිල්ලෙන් අකුරු ලියමින් එය ඉගැන්වූ ... ආකාරය එකල ලියවුන සමහර කුඩා පොත් වලද විස්තරව ඇත. මේ වැල්ලේ ලියූ ... හෝඩිය පුස් කොළයේද ලියමින් තවත් දුරට එය දියුණු කරන ලදී. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස මාතර පලාතේ පරදුව උපන් රතනජෝති නම් හිමි නමක් විසින් ලියන ලද ... පුස්කොළ හෝඩි කීපයක් ඒ ඒ පලාත් වල තිබී අප විසින් දක්නා ලදී. මෙයින් එක් ... පිටපතක් කුලියාපිටිය ප්‍රදේශයේ පැරණි ආරාමයක තිබූ අතර මාතර පලාතේ ස්ථාන ... කීපයකද උන්වහන්සේගේ ඒ හෝඩි පිටපත් ආරක්ෂිතව ඇත. රතනජෝති හිමි... යන්ගේ ශිෂ්‍යයකු විසින් හෝඩි පටුන යයි පිටු කීපයකින් යුත් කවි පොතක් ලියා තිබුණි. මෙය පාඩම් කර ගත හැකි සේ කවියට නගා තිබුණි. රතනජෝති හිමියන්ගේ ලේඛන කුශලතාව ගැන ප්‍රසන්න වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා උන්වහන්සේට නාදුගල කුඹු... රක්ද පුද තිබේ. අප මේ කරුණු මෙහි දක්වන ලද්දේ එද අකුරු ලියවීම පන්සල් අධ්‍යාපනයේ මූලික ලක්ෂණයක් වූ බව දැක්වීමටය.

මෙසේ ආරම්භ වූ මෙකල පන්සල් අධ්‍යාපනය මගින් ශබ්ද නගා කියවීමත් නිවැරදිව උච්චාරණය කිරීමත් ප්‍රධාන අංගය කරගෙන වාචෝද්ගත කරවීම සඳහා සෑහෙන ප්‍රයාසයක් දරණ ලදී. එද පන්සල් අධ්‍යාපනයේ දෙවන ලක්ෂණය වූයේ වාචෝද්ගත කරවීමය. අද මෙන් මුද්‍රණ ශිල්පයක් නොමැති ඒ යුගයෙහි එය අවශ්‍ය යෙන්ම කළ යුත්තක් විය.

**වැලිවිට සංඝරාජ යුගය:**

මහනුවර සමයේ පන්සල් අධ්‍යාපනයේ විශේෂ අභිවෘද්ධියක් ආරම්භ වූයේ වැලිවිට සංඝරාජ යුගයේ බව කෘතඥතා පූර්වකව සිහිපත් කළ යුතුය. එකල පැවති පන්සල් අධ්‍යාපනය කෙබඳුදැයි දැන ගැනීම සඳහා වැලිවිට සංඝරාජ මා හිමියන්ගේ අනුශාසනා පත්‍ර කියවිය යුතුය. සියම් නිකාය පිහිටුවීමට විසි වසකට පෙර ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස් දෙසිය සසැත්තෑවන වර්ෂයෙහි පාතරට සිල්වතුන්ගේ දැන ගැනීම සඳහා එවන ලද අනුශාසනා වට්ටෝරුවෙහි තමන්වහන්සේ අලගල්ල නම් අරණ්‍යසේනා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සනයෙහි සිල්වතුන් හික්මීමේ සේනාසනයක් ආරම්භ කළ බව කියා තිබේ. ඒ වට්ටෝරු පත්‍රයේ සඳහන් වන පරිදි සිල්වතුන් විසින් සාමණේර බණ දහම් ආදිය ඉගෙන පෝයක් පාසා එය සාකච්ඡා කොට එය ධාරණය කළ යුතු බව කියා තිබේ. මෙකල සිල්වතුන් වශයෙන් පෙනී සිටියේ කුඩා කල පැවිදි වූ පිරිසක් නොව වැඩි වයසට පත්ව ශාසනමාමකව ක්‍රියා කළ පිරිසකි. එම නිසා උන්වහන්සේලා විසින් පර්යාප්තිය ආරක්ෂා කර ගත නොහැකි හෙයින් ප්‍රතිපත්ති සංරක්ෂණය කළ යුතු බවට උපදෙස් දී තිබේ. උපසම්පදාව පිහිටුවීමෙන් පසු නැවතත් පාත රට සංඝයාගේ දැන ගැනීම පිණිස එවන ලද විපරම් පත්‍රයෙහි භික්ෂු අධ්‍යාපනය කෙතරම් දුරට සකස් විය යුතුද යන්න විස්තර කොට තිබේ. දැනට ප්‍රතිවේදය අන්තර්ධානව ඇති හෙයින් පර්යාප්තිය හා ප්‍රතිපත්ති ශාසනය රැක ගැනීමට උත්සාහ කළ යුතු බවට මෙහිදී අනුශාසනා කර ඇත. භික්ෂු අධ්‍යාපනයේදී ප්‍රතිපත්තියට මුල් තැන දෙමින් ඊට අනුකූල අධ්‍යාපනයක් ලබා දීමේදී අනුගමනය කළ යුතු ක්‍රම මේ ලිපියේ විස්තර කොට තිබේ.

සාමණේර අධ්‍යාපනය අනුගමනය කළ යුතු ආකාරය දක්වන උන්වහන්සේ හෙරණසිඛ වණපොත් කරවා හෙරණසිඛ විනිසද උගන්වා ආචරිය වත් හා ආගන්තුක වත් ආදිය ද වෙනත් පොත් පත්ද වණපොත් කළ යුතු බව කියා තිබේ. මෙහිදී මූලික අධ්‍යාපනය සාමණේර සීලයට අදළ බණ දහම් වලට සීමා කොට අනතුරුව කටපාඩම් කළ යුතු පොත පත කිය යුතු බව කියනු ලැබේ. මේ කටපාඩම් කළ යුතු පත පොත් ගණයට ශතක පොත් ආදී අක්ෂරෝච්චාරණයට යෝග්‍ය වූ පොත් පත් හා වෙනත් බණ දහම් පොත්ද ඇතුලත් වූ බව සිතිය හැක.

උපසම්පද භික්ෂූන්ගේ අධ්‍යාපනයේදී ප්‍රථමයෙන්ම ප්‍රාතිමෝක්ෂය සන්න සහිතව කංඛාවිතරණී අටුවාවට එක් කරමින් සවිස්තරව උගන්වා පාරාජිකා පාළි, පාචිත්තිය පාළි පොත්ද උගන්වා උන්වහන්සේලාගේ දැනුම පරීක්ෂාකොට සමර්ථතා දක්වන්න වුන්ට හසර දක්විය යුතු යයි කියා තිබේ. මෙහි හසර දැක්වීම නම් සුදුසු ගෞරව සම්මාන පිරිනැමීමෙන් උන්වහන්සේලා සතුටු කරවීමයි. මෙපමණකින් ඒ උපසම්පද භික්ෂූන්ගේ අධ්‍යාපනය අවසන් නොකොට තව දුරටත් ඉගැන්වීම කළ යුතු බව කියන වැලිවිට සංඝරාජ හිමියෝ කුදුසික, මුළ සික, පාලි මුක්තක විනය විනිච්ඡය ආදී විනය ග්‍රන්ථද ඉගැන්විය යුතු බවත් එම අධ්‍යාපනය විනය පිටකයට පමණක් සීමා නොකොට සූත්‍ර පිටකයට අයත් පොත්ද ලක්දිව තිබෙන බණ පොත් හා දේසෙන් ගෙනා පොත්ද ඉගැන්විය යුතුයයි කියති. මෙහි දේසෙන් යනු සියම් රට වැනි විදේශයෙන් ගෙනා පොත් විය යුතුයි. ඉගෙණීමට පමණක් සීමා නොකළ එද අධ්‍යාපනය ප්‍රායෝගික කිරීම සඳහා විනය දේශනා, සීමා සම්මත කිරීම, අබ්භාහන කර්මාදී කටයුතු කිරීම මගින් භික්ෂූන් නියම භික්ෂු ජීවිතයකට අයත් කටයුතුවල දක්ෂයන් බවට පත්කළ බව පෙනේ. විනය ඉගැන්වීම පිළිබඳව විනය පිටකයෙන් බාහිරව සූත්‍ර පිටකයෙහි එන විනය කොටස් ද අප සහ රජ හිමියන් හොඳින් ඉගෙන ධාරණය කොට තිබූ බව මේ වට්ටෝරුවේම තවත් තැනක මෙසේ සඳහන් වේ. එනම් දස ධම්ම සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය, ධම්මදයාද සූත්‍රය, මහාඅරියවංස සූත්‍රය, අනුමාන සූත්‍රය ආදී විනය ධර්මයට අයත් සූත්‍රද ඉගෙන ගතයුතු බව කීහ. "පිරිය යුතු බව අභ්‍යාස කටයුතු බව සෙවිය යුතු බව විශේෂයෙන් උගන්වා" යන මේ වචන වලින් එද පන්සල් අධ්‍යාපනය ගුණධර්ම පූර්ණයට මුලතැන දී උගන්වා අභ්‍යාස කරවා තවදුරටත් පරීක්ෂණ බුද්ධිය මෙහෙයවා පර්යේෂණ කළ යුතු බව කියනු ලැබේ. මෙහි 'සෙවිය යුතු බව' යන වචනය ඉතා වැදගත්ය. මූලික අධ්‍යාපනය ධර්ම විනයානු

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කුලව සිදුකොට වෙනත් උගතමනා දේත් දේසෙන් ගෙනා පත පොතත් හඳරවා එය පරීක්ෂණයට භාජන කළ යුතුයැයි අවසානයට දක්වා තිබීමෙන් සභරප මා හිමි යන්ගේ බුද්ධිය කෙතරම් පළල්ව තිබුණේද යනු අපට සිතා ගත හැක. සහරප හිමි යන්ගේ මේ ලිපිය විපරම් පත්‍රයයි නම්කොට තිබේ. එහි තේරුම පරීක්ෂණය සඳහා ලියුමක් යන්නයි. තමන්වහන්සේගේ ශිෂ්‍යයන් උගෙන කියාගෙන ඒ ඒ ප්‍රදේශවලට වැඩමකළායින් පසුව කෙතරම් දුරට තමා ලැබූ අධ්‍යාපනය ක්‍රියාත්මක වී තිබේදැයි සොයා බැලීම මේ ලිපියේ අදහසයි. මෙය වනාහි අද පරීක්ෂණ වාර්තාවක් සැපයීමට කරන නියෝගයක් මෙනැයි කිව යුතුය.

**ප්‍රගති වාර්තාව: :**

මුලගිරි (මුල්ගිරිගල) විහාරයේ වැඩ සිටි වටරග්ගොඩ ධම්මපාල හිමියන් තමන් වෙත එවන ලද ඉහත සඳහන් විපරම් පත්‍රයට දීර්ඝ වාර්තාවක් සපයා තිබේ. එහි එන කරුණු කැටිකොට ගත්විට අද මෙන් එද ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් එක්තැනකට කැඳවා ඉගැන්වීමක් නොවූ බව සඳහන් වෙයි. එයට හේතු දක්වන ධම්මපාල හිමි දසවිසි නමක් එක තැනක විසීම ප්‍රත්‍යයේ පහසුව අඩුකම නිසා අපහසු වී යැයි ද ඒ නිසා ඒ ඒ තැන දෙතුන් නම බැගින් නතර කර ඉගැන්වීම කරන බව කියයි. එකල අධ්‍යාපනය සඳහා භාවිත කළ පොත් ගැනද උන්වහන්සේ සඳහන් කරයි. පාතිමොක්ඛය ඇතුළු විනය පිටකයේ පොත් ද, පසුකලක ලියනලද පාළි මුක්තක විනය විනිච්ඡය, මූළසික, කුඩුසික, විනය විනිච්ඡය, අතිරේක වශයෙන් සහි පොත් (දීඝ, මජ්ජිම, සංයුත්ත, අංගුත්තර හා බුද්දක නිකාය) ද අභිදනප්පදීපිකා නම් පාළි නිඝණ්ඩුවද, ව්‍යාකරණ වශයෙන් මොග්ගල්ලානපරපුරට අයත් පද සාධනයද, කච්චායන පරපුරට අයත් බාලාවතාරය ද එම පාඨ ග්‍රන්ථ අතර වේ. ව්‍යාකරණ ඉගැන්වීමේදී පද සිද්ධි වැල්ලෙහි ලියූ බව ද සඳහන් වෙයි. විසුද්ධිමාර්ගය ද සම්පූර්ණයෙන් අර්ථ අස්වා ඉගැන් වූ බව කියනු ලැබේ.

ඉහත සඳහන් පාළි ග්‍රන්ථවලට අමතරව සද්ධර්ම රත්නාවලිය වැනි සිංහල ග්‍රන්ථ වලින් ශිෂ්‍යයන් ලවා ධර්මදේශනා කරවා ධර්ම දේශනා සඳහා ප්‍රායෝගික පුහුණුවක්ද දෙන ලදී.

එකල ඉගැන්වීමේ යෙදුනු ආචාර්යවරුන් කීප පොලකගේ නම් ද ඉහත සඳහන් ලේඛනයේ සඳහන් වේ. සුප්‍රසිද්ධ බෝවල ධම්මානන්ද හිමියන්ගේ ගුරුවරයා වූ නලගම මණිරතන හිමි තංගල්ලේ වනවාසි විහාරයේ වැඩ සිටි වෙහැල්ලේ ධම්ම දින්න නා හිමි හා වටරග්ගොඩ ධම්මපාල හිමි එසේ නම් සඳහන් වී ඇති ආචාර්ය වරු වෙති.

නලගම මණිරතන හිමි තම ආරාමයේ භික්ෂූන් වහන්සේලා දෙතුන් නමට අමතරව අසල ආරාම වල නතරව සිටි ශිෂ්‍යයන් කීප දෙනෙකු ගෙන්වා ඉගැන්වීය.

එකල පැවති අධ්‍යාපන ක්‍රමයට අනුව සිසුන්ට පොතපතේ දැනුම ලබාදීම, මහ ජනයාට බුදු දහම විස්තර කරදීමේ අභ්‍යාස, හැරුණුවිට භික්ෂූන්ගේ සීලය මැනවින් පවත්වාගෙන යාමට පොහෝ පවාරණ ආදි විනය කර්ම නොපිරිහෙලා සිදුකළ බව පෙනේ.

ධම්මපාල හිමියන්ගේ ඉහත සඳහන් ලියවිල්ලෙහි අධ්‍යාපනය අතින් දුර්වල සිසුන් සඳහා අනුගමනය කළ වැඩ පිළිවෙළ ගැනද සඳහන් වෙයි. ඒ අනුව ඉගෙනීම

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

අතින් දුර්වල සිසුන්ට බලෙන් උගන්වන්නේ නැතිව ඔවුන් වත් පිළිවෙත් ආදිය කෙරෙහි යොමු කොට ශ්‍රද්ධාව ඇතිකෙන ලෙස ක්‍රියා කර තිබේ.

**හසර දැක්වීම:**

සඟරජ හිමියන්ගේ ලිපියේ උගත් භික්ෂූන්ට 'හසර' දැක්විය යුතු යයි කියා තිබේ. මින් අදහස් කරන ලද්දේ හරසර දැක්වීමයි. උගතුන්ට ගෞරවනාම, පදවිනාම, රාජානුග්‍රහ දෙවීම මෙහිදී සඟරජ හිමියන්ගේ අදහස විය. අධ්‍යාපනය නගා සිටුවීමට මෙබඳු උපාය එද අවශ්‍ය විය.

සිය දක්ෂතාවන් වෙනුවෙන් කඹුරුපිටියේ ගුණරතන හිමියන්ට, සඟරජ හිමියන්ගේ නියමය පරිදි කීර්ති ශ්‍රී රාජසිංහ රජු, 'සභිධර' යන උපාධිය සමග පහත රට සංඝනායක පදවිය පිරිනැමීය. මෙය උඩුදුම්බර මාලිගයේදී සිදුකොට පහතරට සංඝයාගේ දැනගැනීම සඳහා ලිපියක් යවන ලදී. ඒ ලිපිය ආරම්භයේදී එවකට මාතර ප්‍රදේශයේ ප්‍රචලිතව සිටි වටරග්ගොඩ ධම්මපාල, වෙහැල්ලේ ධම්මදින්න, වැව ඉන්දසාර යන හිමිවරුන්ගේ ආශ්‍රයෙන් හැදුනු වැඩුනු බුද්ධ පුත්‍රයන් වහන්සේලාට දැන ගැනීම පිණිස බව සඳහන් වේ.

කඹුරුපිටියේ සභිධර ගුණරතන නා හිමි උසස් අනුස්මරණ ශක්තියකින් කැපී පෙනුන හිමි නමකි. නිඝණ්ඩු ව්‍යාකරණ, ධාතුපාඨ, සහිතව පස්මහා සහිද විනය පිටකයට අයත් පාතිමොක්ඛ, පාරාජිකාපාලි, පාචිත්තියපාලි, විනය පොත්ද ධම්ම සංගණිය ආදි අභිධර්ම පොත්ද විමුක්ති සංග්‍රහය සාරාර්ථ සංග්‍රහය, චුලශික්ෂාප්‍රකරණය යනාදී පසු කල ලියන ලද ග්‍රන්ථද වාචෝද් ගත කරගෙන සංඝරාජ හිමියන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහිත රාජ සභාවේ ධර්ම දේශනා කිරීම නිසා ගුණරතන නාහිමියන්ට එම රාජකීය ගෞරවය ලැබුණි. එය සිදුවූයේ ක්‍රි.ව. 1776 දීය.

ඉහත සඳහන් සිද්ධීන් මගින් එකල පැවති භික්ෂු අධ්‍යාපනය, පාඨ ග්‍රන්ථ වාචෝද් ගත කිරීම, පිළිබඳ තොරතුරු මෙන්ම උගතුන්ට ලැබුණු රාජ්‍ය සම්මාන ගැනද කරුණු අනාවරණය වේ.

පොතපත ලිවීම ගැන උනන්දුව ඇතිකිරීමේ වැඩ පිළිවෙළක්ද එකල පැවතුණි. සභිධර ගුණරතන නා හිමියන්ට පසුව පහතරට නායක ධුරයට පත් කරතොට නා හිමියන් විසින් ලියන ලද බාරස කාව්‍යය ගැන පැහැදුනු රජු ඒ හිමිට පල්ලෙබැද්ද ගම්වරය පූජා කළේය. මේ නාහිමි අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමාගෙන් වැඩිදුර අධ්‍යාපනය ලබා මල්වතු මහා විහාරයේ ගණපරිහරණයේ ද යෙදී සිටියේය. සංඝයාගේ පාලනය හා අධ්‍යාපනය මෙහි ගණපරිහරණය යන්නෙන් අදහස් වේ.

වැලිවිට සරණංකර සඟරජ හිමි කරතොට නා හිමියන්ට ලිපියක් යවමින් ගණ පරිහරණයට සුදුසු ස්ථවිරයන් වහන්සේ නමක් පහතරටින් එවන ලෙස දැන්වීය. එකල පහතරට විසූ ගුණගරුක උගත් භික්ෂූන් වහන්සේලාගේ නාම ලේඛනයක් කරතොට නා හිමි විසින් සඟරජ හිමිට යවා තිබේ. එම නාමලේඛනය දෙස බලනවිට එකල මාතර ප්‍රදේශයේ භික්ෂු අධ්‍යාපනය දියුණුව පැවති බව අනාවරණය වෙයි.

සඟරජ හිමියන්ගේ අභාවයෙන් පසු දරම්ටිපොල ශ්‍රී බුද්ධරක්ඛිත මහා ස්ථවිරයන් වහන්සේ වැනි උගත් භික්ෂු පිරිසක් එකල මහනුවර විසූහ. මාතර විසූ බෝවල ධම්මා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

නන්ද නා හිමි ද දරමිටිපොල නා හිමියන්ගෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබූවෙකි
පරපුරේ අධ්‍යාපන පරිසමාප්තිය සඳහා පාලි හෝ සංස්කෘත භාෂාවෙන් පද්‍ය රචනාව
ලියා ඉදිරිපත් කළ යුතු විය. බෝවල නාහිමියන් තම දක්ෂතාව දක්වීම සඳහා නාහි
යන්ට වන්දනා කිරීම පිණිස රචිත ''සුරත්ත පත්තංගුලි පත්තපන්තිං'' යනාදී ගාථාව
බෝවල නා හිමිගේ ශිෂ්‍ය අමරපුර නිකායේ ආදි කර්තෘ අඹගහපිටියේ නා හිමිය
විසින් ක්ෂණිකව රචිත ''මුකුන්ද නන්දීශ පුරන්දරාදී'' යනුවෙන් පටන්ගන්නා ශ්ලෝ
කයක් ද ප්‍රසිද්ධය. අඹගහපිටියේ නා හිමියන්ගේ පරපුරේ මෑතකාලයේ විසූ යු.
ඥාණතිලක නා හිමියන්ට ද මේ දක්ෂතාව තිබිණි. උන්වහන්සේ බොහෝ අවස්ථාව
හිමුවන ගාථා කියා රැස්ව සිටි අය ප්‍රබෝධ කළහ.

**මාතර භික්ෂු අධ්‍යාපනය:**

මාතර භික්ෂු අධ්‍යාපනය ගැන නොරතුරු සැලකිය යුතු ප්‍රමාණයක් ලැබෙන්නෙ
නරේන්ද්‍රසිංහ රජතුමා දවස සිටය. මේ රජතුමාට පුත් රුවනක් ලබාදෙන ලෙ
මාතර දික්වැල්ලේ කඳවුරුකුල සාමණේරයන් වහන්සේ විසින් රචිත කහකුරු
සංදේශය මෙහිදී අපට ආධාර වෙයි. යථෝක්ත සාමණේරයන් වහන්සේගේ ආචාර්
වරයා ගලගම උනන විහාරයේ වැඩ විසූ දෙවමිත් හිමියන් බව කියනු ලැබේ. මාත
පැරණි අධ්‍යාපන ආයතනයක් වූයේ උනන විහාරයයි. එහි උගත් පඬිවරුන් අත
ඌරුගමුවේ රාජගුරු පඬිතුමා සහ එතුමාගේ ශිෂ්‍ය 1914 දී රචිත මනිචෝර ජාත
කාව්‍යයේ කතුවරයා වූ කුලතුංග පඬිවරයා ද මෙහිලා සඳහන් කළ හැකිය. මනිචෝ
ජාතකය මාතර සාහිත්‍ය යුගයේ පැරණිතම ග්‍රන්ථයයි. ඊට කලින් රචිත රබෙල් අස්
වැනි පොත් කීපයක් තිබුනත් ඒවා එතරම්ම ව්‍යක්ත නැත. උනන විහාරයේ අධ්‍ය
පනය ලත් ගිහි ශිෂ්‍යයෝ බොහෝ වූහ. පැවිදි සිසුන් අතර සිටිනාමළුවේ ධම්මජෝ
හිමියෝ ප්‍රධාන තැනක් ගත්හ. පසුව උන්වහන්සේ මහනුවරට ගොස් සඟරජ හිමියන
සමග එක්ව පතපොත හඳරා දැනුම හුවමාරු කරගත්හ. පසු කාලයේ පිරිවෙන
අධ්‍යාපනයට උන්වහන්සේ මහපාද දුන්හ.

මහනුවර යුගයේ සුළු වශයෙන් පවත්වාගෙන ආ අධ්‍යාපනය නූතන යුගයේ
පිරිවෙන් අධ්‍යාපනයට පදනම විය. එකල ධර්ම විනය හා ශබ්ද ශාස්ත්‍ර වලට මුල්තැන
දුන් එම අධ්‍යාපනයෙන් වැඩි වශයෙන්ම ප්‍රතිපත්ති ගරුක උගත් භික්ෂු පිරිසක් බිහි
කිරීමට හැකිවිය. උන්වහන්සේලා ජාතික ආගමික හා අධ්‍යාපනික ප්‍රබෝධයක්
ඇතිකිරීමට බෙහෙවින් උපකාරී වූහ.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk